ඩොයිෂ් බැංකුව

සමූහය
21 වෙනි මහල, OGF මන්දිරය, 1A මැද පාර, ගාලු මුවදොර, කොළඹ 2
දුරකථන : +94-11-2447062, ෆැක්ස් : +94-11-2447067

මූල්‍ය ප්‍රකාශය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ආයතනික පාලනය

කළමනාකරණ මණ්ඩලය

සමාගමේ යහපත සඳහා තිරසාර වටිනාකම නිර්මාණය කිරීමේ අරමුණින් ඩොයිෂ් කළමනාකරණ මණ්ඩලය නීතියට, එහි සාංගමික ව්‍යවස්ථාවලියට සහ කළමනාකරණ මණ්ඩලයේ යොමු නියමයන්ට අනුකූලව සමාගමේ කළමනාකරණය සඳහා වගකීම දරයි. එය කොටස් හිමියන්ගේ, සේවකයින්ගේ සහ අනෙකුත් සමාගම ආශ්‍රිත පාර්ශවකරුවන්ගේ යහපත සලකා බලයි. බැංකුවේ ව්‍යාපාර කළමනාකරණය සඳහා කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් සාමූහිකව වගකිව යුතුය. කළමනාකරණ මණ්ඩලය, සමූහ කළමනාකරණ මණ්ඩලය ලෙස, සියලුම සමූහ සමාගම් මත සාමාන්‍ය පාලනය ක්‍රියාත්මක කරන ඒකාකාර මාර්ගෝපදේශවලට අනුකූලව ඩොයිෂ් බැංකු සමූහය කළමනාකරණය කරයි;

කළමනාකරණ මණ්ඩලය නීතිය සහ එහි සාංගමික ව්‍යවස්ථාවලිය මගින් නියම කර ඇති පරිදි සියලුම කාරණා තිරණය කරන අතර, නීතිමය අවශ්‍යතා සහ අභ්‍යන්තර මාර්ගෝපදේශ (අනුකූලතාව) වලට අනුකූලතාව සහතික කරයි. එමෙන්ම එය ප්‍රමාණවත් අභ්‍යන්තර මාර්ගෝපදේශ සංවර්ධනය කර ක්‍රියාත්මක කරන බව සහතික කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනී. කළමනාකරණ මණ්ඩලයේ වගකීම්වලට විශේෂයෙන්, බැංකුවේ උපායමාර්ගික කළමනාකරණය සහ දිශානතිය, සම්පත් වෙන්කිරීම, මූල්‍ය ගිණුම්කරණය සහ වාර්තාකරණය, පාලනය සහ අවදානම කළමනාකරණය, ව්‍යාපාර සංවිධානයේ විධිමත් ක්‍රියාකාරිත්වය, සමාගමේ මෙහෙයුම්වල පාරිසරික සහ සමාජීය බලපෑම් ක්‍රමානුකූලව හඳුනාගැනීම සහ තක්සේරු කිරීම මෙන්ම ආයතනික පාලනය ඇතුළත් වේ. කළමනාකරණ මණ්ඩලය විසින් කළමනාකරණ මණ්ඩලයට පහළ ජ්‍යේෂ්ඨ කළමනාකරණ මට්ටම සඳහා පත්කිරීම් සහ විශේෂයෙන්, ගෝලීය වශයෙන් ප්‍රධාන කාර්ය ඉටුකරන්නන් තීරණය කරයි. සමූහය තුළ කළමනාකරණ කාර්යයන්ට පුද්ගලයින් පත් කිරීමේදී, කළමනාකරණ මණ්ඩලය විවිධත්වය සැලකිල්ලට ගන්නා අතර, විශේෂයෙන් කාන්තාවන්ගේ සුදුසු නියෝජනය අත්කර ගැනීමට උත්සාහ දරයි.

කළමනාකරණ මණ්ඩලය විශ්වාසය පිළිබඳ සහයෝගී සම්බන්ධතාවයකින් සහ සමාගමේ ප්‍රතිලාභය පිණිස අධීක්ෂණ මණ්ඩලය සමඟ සමීපව කටයුතු කරයි. කළමනාකරණ මණ්ඩලය විශේෂයෙන්, සමූහයට අදාළ උපායමාර්ගය, අපේක්ෂිත ව්‍යාපාර ප්‍රතිපත්තිය, සැලසුම්කිරීම, ව්‍යාපාර සංවර්ධනය, අවදානම් අවස්ථාව, අවදානම් කළමණාකරණය, සේවක සංවර්ධනය, කීර්තිනාමය සහ අනුකූලතාවයට අදාළ සියළුම ගැටළු සම්බන්ධයෙන් නිතිය සහ පරිපාලන මාර්ගෝපදේශ වලින් නියමකළ විෂයපථය තුළ අවමයකින් අධීක්ෂණ මණ්ඩලයට වාර්තා කරයි. අපගේ කළමනාකරණ මණ්ඩලයේ රාජකාරි, වගකිම් සහ ක්‍රියාපටිපාටි පිළිබඳ විස්තරාත්මක ඉදිරිපත් කිරීමක් එහි යොමු නියමයන්හී විශේෂයෙන් දක්වා ඇති අතර, එහි වර්තමාන පිටපත අපගේ වෙබ් අඩවියෙන් (www.db.com/ir/en/documents.htm) ලබාගත හැක.

අධීක්ෂණ මණ්ඩලය

ඩොයිස් බැංකුව ඒජී හි අධීක්ෂක මණ්ඩලය කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් පත්කර ඉවත් කරන අතර, කළමනාකරණ මණ්ඩලයට අධීක්ෂණය කර උපදෙස් ලබා දෙමින් බැංකුවට මූලිකවම වැදගත්වන තිරණවලදී සෘජුවම සම්බන්ධ වේ. අධීක්ෂණය හා උපදේශයට විශේෂයෙන් තිරසාරාත්මක ගැටළු ඇතුළත් වේ. අධීක්ෂණ මණ්ඩලය විශ්වාසය පිළිබඳ සහයෝගී සම්බන්ධතාවයකින් සහ සමාගමේ යහපත වෙනුවෙන් එකට සමීපව කටයුතු කරයි. අධීක්ෂණ මණ්ඩලය සහ එහි කමිටුවල අභ්‍යන්තර සංවිධානය මෙන්ම එහි සාමාජිකයින් සඳහා අවශ්‍යතා ජර්මන් බැංකු පනත (Kreditwesengesetz (KWG)) රෙගුලාසි සහ ජර්මන් ආයතනික පාලන සංග්‍රහයේ (CGCG) නිර්දේශවලට පමණක් නොවල විශේෂ අධීක්ෂණ අවශ්‍යතාවන්ටද යටත් වේ. වෙනත් දෑ අතර, එවැනි අවශ්‍යතා ජර්මන් බැංකු පනත (KWG), ආයතන සඳහා පාරිශ්‍රමික ආඥාපනත (Institutsvergütungsverordnung (InstitutsVergV)), යුරෝපා බැංකු අධිකාරියේ මාර්ගෝපදේශ (EBA) සහ යුරෝපා සුරැකුම්පත් හා වෙළෙඳපොල අධිකාරිය (ESMA) සහ යුරෝපා මහ බැංකුවේ පරිපාලන ව්‍යවහාර (ECB) අපගේ විචක්ෂණ අධීක්ෂණ අධිකාරිය ලෙස සොයා ගත හැක. තනි පුද්ගල සිද්ධි තුළ, නියාමන අවශ්‍යතා ජර්මන් ආයතනික පාලන සංග්‍රහයේ (CGCG) නිර්දේශවලින් වෙනස් විය හැකිය.

අධීක්ෂණ මණ්ඩලයේ අනුමැතිය අවශ්‍යවන ගනුදෙනුකළ යුතු ව්‍යාපාර වර්ග ඩොයිස් බැංකුව ඒජී හී සාංගමික ව්‍යවස්ථාවලියේ දක්වා ඇත. තවද, අධීක්ෂණ මණ්ඩලය එහි අනුමැතිය අවශ්‍ය වන අමතර ගනුදෙනු විස්තර කරනු ඇත.

අධීක්ෂණ මණ්ඩලයේ ක්‍රියාපටිපාටි සහ අධීක්ෂණ මණ්ඩල කමිටුවල කාර්යයන් සහ ක්‍රියාපටිපාටි එයට අදාළ යොමු නිර්දේශවල දක්වා ඇති අතර, එහි වර්තමානයට අදාළ පිටපත් ඩොයිස් බැංකුවේ වෙබ් අඩවිය (www.db.com/ir/em/documents.htm) හි ප්‍රකාශ කෙරේ. අධීක්ෂණ මණ්ඩලය කළමනාකරණ මණ්ඩලය නොමැතිව නිතිපතා රැස්වේ. ඊට අමතරව, සේවකයින්ගේ නියෝජිතයින් සහ කොටස් හිමියන්ගේ නියෝජිතයින් වෙන වෙනම මූලික සාකච්ඡා නිතිපතා පවත්වයි. රැස්වීම් ගණන සහ ඒවා ක්‍රියාත්මකවීම අධීක්ෂක මණ්ඩලය සහ එහි කමිටුවල වැඩ පිළිබඳ විස්තර සමඟ අධීක්ෂණ මණ්ඩලයේ වාර්තාවේ දක්වා ඇත.

අධික්ෂක මණ්ඩලයේ සභාපති අධීක්ෂණ මණ්ඩලයේ විධිමත් ක්‍රියාකාරිත්වය තුළ තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන අතර, එහි නායකත්ව කාර්යභාරයක් ඇත, ඔහුට අධීක්ෂණ මණ්ඩලයේ අභ්‍යන්තර සංවිධානය සහ සන්නිවේදනයන්, අධීක්ෂණ මණ්ඩලය තුළ වැඩවල සම්බන්ධීකරණය සහ කළමනාකරණ මණ්ඩලය සමඟ අධීක්ෂණ මණ්ඩලයේ මැදිහත්වීම සම්බන්ධයෙන් අභ්‍යන්තර මාර්ගෝපදේශ සහ මූලධර්ම නිකුත් කළ හැක. අධික්ෂක මණ්ඩලයේ සභාපති අධීක්ෂණ මණ්ඩලයට අදාළ මාතෘකා පිළිබඳ අවශ්‍ය අවස්ථාවලදී ආයෝජක සාකච්ඡාවල දී සහභාගි වන අතර, එවැනි සාකච්ඡාවල හරය පිළිබඳ අධීක්ෂණ මණ්ඩලයට නිරන්තරයෙන් දැනුම් දේ. මේ මගින් පාරිසරික, සමාජීය සහ පාලන (ESG) මාතෘකා ආවරණය කරයි. තවද, විගණන කමිටුවේ සභාපති රැස්වීම්වලින් පිටත විගණක සමඟ නිරන්තර සාකච්ඡා පවත්වනු ලබයි.

ගනුදෙනු කිරිම සඳහා අධීක්ෂණ මණ්ඩලයේ අනුමැතිය අවශ්‍ය වන ව්‍යාපාර වර්ග ඩොයිෂ් බැංකුව ඒජී හි සාංගමික ව්‍යවස්ථාවලියේ විස්තර කර ඇත. තවද, අධීක්ෂණ මණ්ඩලයට සිය අනුමැතිය අවශ්‍යවන අතිරේක ගනුදෙනුද විස්තර කළ හැක. අධීක්ෂණ මණ්ඩලය කළමනාකරණ මණ්ඩලය නොමැතිව ද නිරන්තරව හමුවේ. නිසි සලකා බැලීමෙන් පසු සහ සුදුසු වන අවස්ථාවක, අධීක්ෂණ මණ්ඩලයට හෝ එහි කමිටුවලට ඔවුන්ගේ කාර්යය ඉටු කිරීම පිණිස, විගණකවරුන්, නීති උපදේශකයින් සහ වෙනත් අභ්‍යන්තර හෝ බාහිර උපදේශකයින්ගෙන් උපදෙස් ලබා ගත හැකිය. ඔවුන්ගේ කාර්යය ඉටු කිරීමේදී, අධීක්ෂණ මණ්ඩලයේ සභාපති කමිටුවල සභාපතිවරු සහ අධීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින්ට කළමනාකරණ මණ්ඩලයෙන් ස්වාධින කළමනාකරණ මණ්ඩලයේ අධීක්ෂණ මණ්ඩල කාර්යාලය විසින් සහය ලබා දේ.

කළමනාකරණ මණ්ඩලය සමඟ, අධීක්ෂණ මණ්ඩලය දිගුකාලීන අනුප්‍රාප්තික සැලැස්ම පිළියෙල කරයි. කළමනාකරණ මණ්ඩලය මත විවිධත්වය ප්‍රවර්ධනය කිරීම අධීක්ෂණ මණ්ඩලයට ඉතා වැදගත්වන අතර, මාතෘකාව තීව්‍ර ලෙස ආමන්ත්‍රණය කරයි. එය කළමනාකරණ මණ්ඩලයේ විවිධත්වය එනම් ස්ත්‍රීපුරුෂභාවය, ජාතිකත්වය සහ වයස මෙන්ම විවිධ පසුබිම් සහ මනෝ විහිතීන් අනුව සක්‍රියව කටයුතු කරමින් සිටී. නාමයෝජනා කමිටුව බැංකුවේ කළමනාකරණ මණ්ඩලයේ තනතුරක් පිරවීමට සුදුසු අපේක්ෂකයින් හඳුනා ගැනීමේදී සභාපතිතුමාගේ කමිටුවට සහ අධීක්ෂණ මණ්ඩලයට සහය වේ. එසේ කරමින්, මෙම කමිටුව අපේක්ෂක පැතිකඩක් සහිත තනතුරු විස්තරයක් සකස් කරන අතර අපේක්ෂිත කාල බැදීම සඳහන් කරයි. සමහර අවසථාවලදී සුදුසු අපේක්ෂකයා බාහිර බඳවාගැනීමේ උපදේශකයින් සමඟ සහයෝගීත්වයෙන් හඳුනා ගන්නා අතර, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලබයි. බාහිර අපේක්ෂකයින් සමඟ මෙම අනුප්‍රාප්තික සැලැස්ම හැර, කළමනාකරණ මණ්ඩලය සහ අධීක්ෂණ මණ්ඩලය අභ්‍යන්තර අපේක්ෂක ලැයිස්තුව පවත්වා ගනී. නාමයෝජනා කමිටුව සහ අධීක්ෂණ මණ්ඩලය අනුප්‍රාප්තික සැලැස්ම සඳහා අභ්‍යන්තර අපේක්ෂකයින් පිළිබඳ කළමනාකරණ මණ්ඩලයෙන් වාර්තා සහ කළමනාකරණ මණ්ඩලයේ දෘෂ්ටි කොණයෙන් ක්‍රියාවලිය නිරන්තරව ලබාගනී. සුදුසු අපේක්ෂකයින් තෝරා ගැනීම සඳහා, බාහිර සහ අභ්‍යන්තර, නාමයෝජනා කමිටුව කළමනාකරණ මණ්ඩලයේ සියලු සාමාජිකයින්ගේ දැනුම, නිපුනතා සහ පළපුරුද්ද පිළිබඳ තුළනය සහ විවිධත්වය සැලකිල්ලට ගනී. එමෙන්ම එය නිදසුනක් ලෙස ස්ත්‍රීපුරුෂභාවය, ජාතිකත්වය සහ වයස සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලයේ විවිධත්වය පෝෂණය කිරීමට උත්සාහ ගනී.

නාමයෝජනා කමිටුවේ වැඩ මත ගොඩ නැගෙමින්, සභාපතිතුමාගේ කමිටුව අධීක්ෂණ මණ්ඩලයේ යෝජනාව සඳහා නිර්දේශයක් ඉදිරිපත් කරයි. මේ මත පදනම්වී, අධීක්ෂණ මණ්ඩලය කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් පත් කිරීම පිළිබඳ තීරණය කරයි. පළමු පත්වීම් කාලසිමාව උපරිම වශයෙන් වසර තුනකි. කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් නීතියට අනුව වසර පහත උපරිමයක් වියහැකි ධූර කාල එකක් හෝ කිහිපයක් සඳහා පත් කරනු ලැබිය හැකිය. ඩොයිස් බැංකුවේදී එවැනි නැවත පත් කිරීම් සාමාන්‍යයෙන් වසර තුනක උපරිමයක් විය යුතුය. කළමනාකරණ මණ්ඩලයේ පත්කිරීම සඳහා යෝජනාවන් හැර, සභාපතිතුමාගේ කමිටුව අධීක්ෂණ මණ්ඩලය තිරණය කරන කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් පහ කිරීම සඳහා යෝජනා ද ඉදිරිපත් කරයි.

අධීක්ෂණ මණ්ඩලය කොටස් සංස්ථා පනතේ (AktG) 76 (3අ) වගන්තියට අනුව නීතියෙන් අවශ්‍ය කරන අවම ස්ත්‍රීපුරුෂ සහභාගිත්වය සමඟ අනුකූලතාව සහතික කරයි. කළමනාකරණ මණ්ඩලය කාන්තාවන් දෙදෙනක් එනම්: ක්‍රිස්ටියානා රිලේ සහ රෙබෙකා සෝට් ඇතුළුව 2023 මැයි 17 දක්වා සාමාජිකයින් දස දෙනෙකුගෙන් සමන්විත විය. ක්‍රිස්ටියානා රිලේ බැංකුවෙන් ඉවත්වීමට තීරණය කළ අතර එබැවින් කළමනාකරණ මණ්ඩලය එතැන් සිට සාමාජිකයින් ප්‍රමාණය නවයක් දක්වා අඩු වු අතර එක් කාන්තා සාමාජිකාවක් එනම් රෙබෙකා සෝට් එයට අයත් විය. වඩා කුඩා කළමනාකරණ මණ්ඩලය පිළිබඳ අභ්‍යන්තර සහ බාහිර ප්‍රතිපෝෂණ එහි කාර්යක්ෂමතාව පිළිගැනීමේදී පොදුවේ ඉතා ධනාත්මක විය. කෙසේවෙතත් 2023 මහ සභා රැස්වීමේදී සඳහන් කළ පරිදි, අධීක්ෂණ මණ්ඩලය වර්තමාන කාන්තා අනුපාතය පිළිබඳ සෑහීමට පත් නොවන අතර, අනාගතයේදී කාන්තා ප්‍රතිශතය ඉහළ දැමීමට අපේක්ෂා කරයි. සුදුසු අභ්‍යන්තර කාන්තා අපේක්ෂිකාවන්ගේ ගණන වැඩි කර ගැනිමට, අධීක්ෂණ මණ්ඩලය විසින් කළමනාකරණ මණ්ඩලයට පහළ ජ්‍යේෂ්ඨ කළමනාකරණ තනතුරුවලට සෘජුව කාන්තාවන් පත් කිරීම සඳහා වර්තමාන මූල්‍ය වසර සඳහා අනුරූප පරමාර්ථයක් සකස් කළ අතර කළමනාකරණ මණ්ඩලයේ නව වැටුප් ගෙවීම් ක්‍රමයේ දිගුකාලීන කාර්යසාධන ප්‍රමිති තුළ එහි පරමාර්ථ ඇතුළත් කරන ලදී. මෙම වර්ගීකරණය තුළ 100%ක ජයග්‍රහනයක් ලඟාකර ගැනිම සඳහා, 2026 වන විට කළමනාකරණ මණ්ඩලයේ මට්ටම් දෙකට පහළ කාන්තාවන් අවම වශයෙන් 32.5%ක් ඉදිරිපත් කිරීම අවශ්‍ය වී ඇත.

වැටුප් ගෙවිමේ පාලන කමිටුවේ යෝජනා මත පදනම් වී, අධීක්ෂණ මණ්ඩලය කළමනාකරණ මණ්ඩලයේ තනි පුද්ගල සාමාජිකයින්ගේ මුළු වැටුප් ගෙවීම තිරණය කරන අතර කළමනාකරණ මණ්ඩලයේ වැටුප් ගෙවීම් ක්‍රමය නිරන්තරව සමාලෝචනය කර යෝජනා ඉදිරිපත් කරයි.

අධීක්ෂණ මණ්ඩලයට නීතියෙන් හෝ පරිපාලන මාර්ගෝපදේශ මගින් දක්වා ඇති විෂය පථය තුළ විශේෂයෙන් උපායමාර්ගය, අපේක්ෂිත ව්‍යාපාර ප්‍රතිපත්තිය, සැලසුම් කිරීම, ව්‍යාපාර සංවර්ධනය, කීර්තිනාමය සහ අනුකූලතාවය සම්බන්ධයෙන් සමූහය සඳහා අදාළ සියලුම ගැටළු පිළිබඳ වාර්තා කළමනාකරණ මණ්ඩලයෙන් ලැබේ. තවද, සමූහයේ විගණනය විසින් ද අනවශ්‍ය ප්‍රමාදයක් නොමැතිව නිරතුරුව හඳුනාගන්නා යම් ඌනතා සහ බරපතල විෂමතා විගණන කමිටුවට දැනුම් දේ. ඊට අමතරව, අධීක්ෂණ මණ්ඩලය සහ කළමනාකරණ මණ්ඩලයේ සභාපති නියාමන මාතෘකා සඳහා විශේෂයෙන් තොරතුරු පාලන තන්ත්‍රයක්, පොදු සහභාගිත්ව (මැදිහත්වීම) ප්‍රෙටෝකෝලයක්, සහ වෙනත් සහභාගිත්ව (මැදිහත්වීම) ප්‍රෙටෝකෝලයක් යොදා ගෙන ඇත. මේවා මගින් අධීක්ෂණ මණ්ඩලයට වාර්තා කිරීම පමණක් නොව වෙනත් දේ අතර සමාගමේ සේවකයින්ගෙන් තොරතුරු සඳහා අධීක්ෂණ මණ්ඩලයේ විමසීම් සහ ඉල්ලීම් මෙන්ම රැස්වීම් සහ රැස්වීම් අතර සූදානම්වීම සම්බන්ධයෙන් තොරතුරු හුවමාරුවද නියාමනය කරයි.

අධීක්ෂණ මණ්ඩලයේ කමිටු

අධීක්ෂණ මණ්ඩලය පහත සඳහන් ස්ථාවර කමිටු අට ස්ථාපිත කර ඇත, ඒවානම්- සභාපතිගේ කමිටුව, නාමයෝජනා කමිටුව, විගණන කමිටුව, අවදානම් කමිටුව, නියාමන පාලන කමිටුව (මෙයට පෙර ඒකාබද්ධ කමිටුව) පාරිතෝෂික හා දීමනා පාලන කමිටුව, උපාය මාර්ග හා තිරසාර කමිටුව, (මෙයට පෙර උපාය මාර්ග කමිටුව) සහ තාක්ෂණ, දත්ත සහ නවෝත්පාදන කමිටුව වේ. අවශ්‍ය ප්‍රමාණයට, කමිටු ඔවුන්ගේ කටයුතු සම්බන්ධිකරණය කරන අතර ආවස්ථික පදනමක් මත එකිනෙකාගෙන් උපදෙස් ගනී. කමිටු සභාපතිවරුන් කමිටුවල වැඩ පිළිබඳ අධීක්ෂණ මණ්ඩලයට නිරන්තරයෙන් වාර්තා කරයි. ස්ථාවර කමිටුවල කාර්යය සහ වැඩිදුර විස්තර වෙනම යොමු නියමයන් තුළ නියාමනය කෙරේ. එහි වර්තමාන පිටපත ඩොයිෂ් බැංකුවේ වෙබ් අඩවියෙන් ලබාගත හැකිය. (www.db.com/ir/en/documents.htm).

සභාපතිතුමාගේ කමිටුව

ඇලෙක්සැන්ඩර් වයිනැන්ඩ්ට්ස්, සභාපති, ටිමෝ හෙයිඩර් (2023 මැයි 17 සිට), ඩෙට්ලෙෆ් පොලස්වෙක් (2023 මැයි 17 දක්වා), ප්‍රෑන්ක් වර්නේක් (2023 මැයි 17 දක්වා), මහාචාර්ය වෛද්‍ය නෝබට් වින්කේල්ජොහැන් කමිටුවේ සාමාජිකයින් වෙති.

සභාපතිගේ කමිටුව අධීක්ෂණ මණ්ඩලයේ රැස්වීම් සූදානම් කිරිම සඳහා සහ අධීක්ෂණ මණ්ඩලයේ රැස්වීම් අතර වර්තමාන ව්‍යාපාර මෙහෙයවීම, කළමනාකරණ මණ්ඩලය සඳහා දිගු කාලීන අනුප්‍රාප්තික සැලැස්ම ඇතුළුව කළමනාකරණ මණ්ඩලයේ පත්කිරිම සහ සේවයෙන් ඉවත් කිරීම පිළිබඳ අධීක්ෂණ මණ්ඩලයේ තිරණ සකස් කිරිම මෙන්ම නාමයෝජනා කමිටුවේ නිර්දේශ සැලකිල්ලට ගැනීම, කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින්ගේ පාරිශ්‍රමිකය පිළිබඳ තීරණය කිරීමට අධීක්ෂණ මණ්ඩලයේ පූර්ණ තනි අධිකාරිය පිළිබඳ ප්‍රතිෂ්ඨාව තුළ රැකියා සහ විශ්‍රාම ගිවිසුම් අවසන් කිරීම, සංශෝධනය සහ අවසන් කිරීම, සහ පාරිතෝෂික හා දීමනා පාලන කමිටුවේ නිර්දේශ සැලකිල්ලට ගැනීම, කළමනාකරණය මණ්ඩලයේ සාමාජිකයෙක් ලෙස නම්කරන ඩොයිෂ් බැංකුව ඒජී හි (Generalbevollmächtigter) සාමාන්‍යාධිකාරී සඳහා ගිවිසුම් සහ/හෝ ගිවිසුම්වලට සංශෝධන පිළිබඳ මතයක් අවශ්‍ය අවස්ථාවලදී ප්‍රකාශ කිරීම, කොටස් සංස්ථා පනතේ 12 වගන්තියට අනුව කළමනාකරණ මණ්ඩලයේ සක්‍රිය සහ හිටපු සාමාජිකයින් සමඟ වෙනත් ගිවිසුම්ගත ව්‍යාපාර මෙහෙයවීම, අභිනියෝග, ගරු තනතුරු හෝ ඩොයිෂ් බැංකු සමූහයේ කළමනාකරණ මණ්ඩලයෙන් පිටත විශේෂ කාර්යයන් අනුමැතිය, මෙන්ම නාමයෝජනා කමිටුවේ නිර්දේශ සැලකිල්ලට ගැනීම, කළමනාකරණ මණ්ඩලයේ සභාපතිවරුන් සහ/හෝ ප්‍රධාන අවදානම් නිලධාරී සහ උපදේශකත්වයෙන් කළමනාකරණ මණ්ඩල සාමාජිකයෙක් අදාළ රහසිගත අභ්‍යන්තර දත්ත බැඳියා පිළිගැටුම් ඇත්නම් මිස භාරදිම සඳහා අනුමැතිය, කොටස් සංස්ථා පනතේ 114 වගන්තියට අනුව අධීක්ෂණ මණ්ඩල සාමාජිකයින් සමඟ ගිවිසුම් අනුමැතිය, ආයතනික පාලන ක්ෂේත්‍රය තුළ අධීක්ෂණ මණ්ඩලයේ තීරණ සකස් කිරීම, අනුකූලතාවය ප්‍රකාශ කිරීමත් සමඟ වෙනස් වූ සැබෑ සැබෑ වාතාවරණය සහ සත්‍යාපනයට අනුකූලතාව පිළිබඳ වාර්ෂික ප්‍රකාශනය ගැලපිමක් මත අධීක්ෂණ මණ්ඩලයේ ස්ථානය තුළ තීරණ, අවශ්‍ය අවස්ථාවල විගණකවරුන්, ප්‍රවීනයින්, නෛතික සහ වෙනත් උපදේශකයින්ගේ උපදේශන සඳහා අධීක්ෂණ මණ්ඩලයේ සහ එහි කමිටුවල පිරිවැය පිළිබඳ අවශ්‍ය අවස්ථාවල මතයක් ප්‍රකාශ කිරීම, හානි සඳහා හිමිකම් ඉල්ලා සිටීම පිළිබඳ අධීක්ෂණ මණ්ඩලයේ තීරණ සඳහා නිර්දේශ සකස් කිරීම, හෝ කළමනාකරණ මණ්ඩලයේ නායකයින් සහ හිටපු සාමාජිකයින්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනිම සඳහා වගකීමට බැඳී සිටී. අවශ්‍ය පරිදි, නියාමන පාලන කමිටුවේ සභාපතිගේ ප්‍රවීනත්වය කමිටුව ලබා ගනි.

නාමයෝජනා කමිටුව

ඇලෙක්සැන්ඩර් වයිනැන්ඩ්ට්ස්, සභාපති, මයිරී ක්ලාක්, ටිමෝ හෙයිඩර් (2023 මැයි 17 සිට), ඩෙට්ලෙෆ් පොලස්වෙක් (2023 මැයි 17 දක්වා), ප්‍රෑන්ක් වෙවුල්ස් (2023 මැයි 17 සිට), ප්‍රෑන්ක් වර්නේක් (2023 මැයි 17 දක්වා), මහාචාර්ය වෛද්‍ය නෝබට් වින්කේල්ජොහැන් කමිටුවේ සාමාජිකයින් වෙති.

බැංකුවේ කළමනාකරණ මණ්ඩලයේ තනතුරක් පිරවීමට අපේක්ෂකයින් හඳුනා ගැනීම සඳහා නාමයෝජනා කමිටුව වගකීමට බැඳී සිටී. එසේ කරමින්, කමිටුව කළමනාකරණ මණ්ඩලයේ සියලුම සාමාජිකයින්ගේ දැනුම, කුසලතා සහ පළපුරුද්ද පිළිබඳ තුලනය සහ විවිධත්වය සැලකිල්ලට ගනිමින් අපේක්ෂකයාගේ විස්තර සමඟ තනතුරු විස්තරයක් සකස් කර, කාර්යයට අදාළ කාල බැඳිම, කළමනාකරණ මණ්ඩලයේ අනුප්‍රාප්තික සැලැස්ම පිළිබඳ විශේෂ අවධානයක් සහිතව දක්ෂතා සංවර්ධනය සහ විවිධත්වය ප්‍රවර්ධනය, අධීක්ෂණ මණ්ඩලය මත අඩුවෙන් නියෝජනය වන ස්ත්‍රීපුරුෂභාවයේ නියෝජනය ප්‍රවර්ධනය කිරීමේ පර්මාර්ථයක් ඇති කිරිම මෙන්ම මෙය අත්කර ගැනීම සඳහා උපායමාර්ගයක් ලෙස, අධීක්ෂණ මණ්ඩලයේ කමිටුවලට පත්කිරීම් සඳහා යෝජනා සංවර්ධනය, ඩොයිස් බැංකුව ඒජී හි කළමනාකරණ මණ්ඩලයේ සහ අධීක්ෂණ මණ්ඩලයේ වෘත්තිය සුදුසුකම්, පුද්ගල විශ්වාසය සහ ලබාගතහැකි කාලය පිළිබඳ තනි සහ සාමූහික ඇගයීම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම, ("යෝග්‍යතා මාර්ගෝපදේශය") මෙන්ම යෝග්‍යතා මාර්ගෝපදේශයේ, කළමනාකරණ මණ්ඩලයේ සහ අධීක්ෂණ මණ්ඩලයේ ව්‍යුහය, ප්‍රමාණය, සංයුතිය සහ කාර්යසාධනය සම්බන්ධයෙන් අවම වශයෙන් වසරකට වරක් පැවැත්විය යුතු නිරන්තර ඇගයීමේ ඵලදායිත්වය නියාමනය කිරීම සහ මේ සම්බන්ධයෙන් සාමූහිකව කළමනාකරණ මණ්ඩලයේ සහ අධීක්ෂණ මණ්ඩලයේ මෙන්ම අදාළ ආයතනවල සාමාජිකයින්ගේ දැනුම, කුසලතා සහ පළපුරුද්ද සම්බන්ධයෙන් අවම වශයෙන් වසරකට වරක් පැවැත්විය යුතු නිරන්තර ඇගයීම සම්බන්ධව අධීක්ෂණ මණ්ඩලය වෙත නිර්දේශ කිරීම, සහ යෝග්‍යතා මාර්ගෝපදේශයේ පිරිවිතරවලට අනුකූලව අනෙකුත් සියලු අවස්ථාවලදී කළමනාකරණ මණ්ඩලයේ සහ අධීක්ෂණ මණ්ඩලයේ මෙන්ම අදාළ ආයතනවල සාමාජිකයින්ගේ ඇගයීම, කළමනාකරණ මට්ටමෙන් පහළ පුද්ගලයින් තෝරා ගැනීම සහ පත්කිරීම සඳහා කළමනාකරණ මණ්ඩලයේ මූලධර්ම පිළිබඳ සමාලෝචනය සහ අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ නාමයෝජනාවක් ඉදිරිපත් කිරීම තුළින් දෙවැනි නියෝජ්‍ය සභාපති තෝරා ගැනීම පිළිබඳ තිරණය සම්බන්ධව කළමනාකරණ මණ්ඩලයට සිදුකරනු ලබන නිර්දේශ සඳහන් කරයි.

විගණන කමිටුව

ප්‍රෑන්ක් විටර්, සභාපති, සුසේන් බිලෙයිඩ් (2023 මැයි 17 සිට), මන්ජා එයිෆර්ට්, බිර්ගිට් ලවුමන් (2023 මැයි 17 සිට 2024 ජනවාරි 12 දක්වා) ගාබ්රිලේ ප්ලට්චර් (2023 මැයි 17 දක්වා), ඩෙට්ලෙෆ් පොලස්වෙක් (2023 මැයි 17 දක්වා), බර්න්ඩ් රෝස් (2023 මැයි 17 දක්වා), ගාර්ලින්ඩේ සිබර්ට් (2023 මැයි 17 සිට), ආචාර්ය ඩග්මර් වල්කාසල්, ස්ටේෆන් විර්ටෙල් (2023 මැයි 17 දක්වා), අචාර්ය තෝඩා වෙයිමර්, මහාචාර්ය වෛද්‍ය නෝබට් වින්කේල් ජොහැන්ල ඇලෙක්සැන්ඩර් වයිනැන්ඩ්ට්ස් (2023 මැයි 17 දක්වා) කමිටුවේ සාමාජිකයින් වෙති.

අවදානම් කළමනාකරණ ක්‍රමයේ විශේෂයෙන් තිරසාරභාවය ආශ්‍රිත ගැටළු ඇතුළුව අභ්‍යන්නර පාලන පද්ධතියේ සහ අභ්‍යන්තර විගණන පද්ධතියේ ඵලදායිත්වය, මූල්‍ය ප්‍රකාශ විශේෂයෙන් විගණකවරයාගේ ස්වාධීනත්වය සහ විගණකවරයා විසින් සපයන ලද අමතර සේවා සම්බන්ධයෙන් විගණනය, සහ විශේෂයෙන් අවදානම් පාලනයේ දුර්වලතා, ප්‍රතිපත්ති, නීති සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූල නොවීම සම්බන්ධයෙන් අභ්‍යන්තර හා බාහිර විගණන මත පදනම් වි විගණක සහ බැංකුවේ අභ්‍යන්තර පාලන කාර්යයන් විසින් හඳුනාගත් විෂමතා සම්බන්ධව - සුදුසු ක්‍රියාමාර්ග තුළින් -කළමනාකරණ මණ්ඩලයේ කඩිනම් පිළියම් යෙදීම සඳහා විගණන කමිටුව වගකීමට බැඳි සිටී.

විගණන කමිටුවට දත්ත වාහකවල ගබඩා කර ඇති තොරතුරු සහ තිරසාරභාවය ආශ්‍රිත දත්ත ඇතුළව බැංකුවේ සියලුම ව්‍යාපාර ලිපි ලේඛණ පරීක්ෂා කිරීමට බලය ඇත.

අවදානම් කමිටුව

මයිරී ක්ලාක්, සභාපති, ලුඩ්විග් බිගෝමෙයර් - බර්ටෙන්ස්ටෙයින් (2023 මැයි 17 දක්වා), ජෑන් ඩස්වෙක්, ජර්ලින්ඩේ සීබර්ට් (2023 මැයි 17 සිට), ස්ටේෆන් සුක්ලාස්කි (2023 මැයි 17 සිට), මයිකල් ට්‍රොග්නි, ස්ටේෆන් විර්ටෙල් (2023 මැයි 17 දක්වා), මහාචාර්ය වෛද්‍ය නෝබට් වින්කේල්ජොහැන්ල ඇලෙක්සැන්ඩර් වයිනැන්ඩ්ට්ස් කමිටුවේ සාමාජිකයින් වෙති.

සමස්ථ අවදානම් රුචිය සහ අවදානම් උපායමාර්ගය පිළිබඳ අධීක්ෂණ මණ්ඩලයට උපදෙස් ලබාදීම, සහ ජ්‍යේෂ්ඨ කළමනාකරණ මට්ටම විසින් ප්‍රකාශිත අවදානම් රුචිය සහ අවදානම් උපායමාර්ගය ක්‍රියාත්මක කිරීම නියාමනය, විශේෂයෙන් මෙම කමිටුව පීඩන යටතේ සහ විවිධ පීඩන පරීක්ෂණ ක්‍රියාදාම ඇතුළුව වර්තමාන සහ ඉදිරිය දකින අවදානම් නිරාවරණ පාලනය කිරිම, අවදානම් රුචි ප්‍රකාශය සහ උපායමාර්ගික ප්‍රාග්ධන සහ මූල්‍ය සැලසුම් සහ පාරිශ්‍රමික ව්‍යවහාර සමඟ එහි අනුරූපතාව සහ පෙළ ගැසීම සමාලෝචනය කිරීම, අවදානම් රුචි ප්‍රකාශය සම්බන්ධ කළමනාකරණ මණ්ඩලයේ ක්‍රියාත්මක කිරීම පාලනය කිරීම, අවදානම් සංස්කෘතියේ වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලයේ වාර්තාකරණය පාලනය කිරීම, ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා කළමනාකරණය සඳහා මෙන්ම ණය, වෙළෙඳපොල, ද්‍රවශීලතාවය, කාර්ය මණ්ඩලය මෙන්ම කීර්තිනාම අවදානම් සහ ESG උපායමාර්ගය ප්‍රකාශිත අවදානම් රුචියට අනුකූලබව සහතික කිරීම වැනි බැංකුවේ සියලුම වැදගත් අවදානම් (මූල්‍ය සහ මූල්‍ය නොවන) සඳහා උපායමාර්ග පාලනය කිරීම, ඒකාබද්ධ පදනමක් මත සහ අවදානම් වර්ග අනුව අවදානම් උපායමාර්ග සාකච්ඡා කිරීම, සහ සුදුසු පරිදි ඒ පිළිබඳව අධීක්ෂණ මණ්ඩලයට නිර්දේශ සිදු කිරීම, අදාළ අවදානම් ප්‍රතිපත්ති හා රෙගුලාසිවලට ඩොයිෂ් බැංකුව ඒජී විසින් පිළිපැදීම ප්‍රවර්ධනය කිරීමට කළමනාකරණය මණ්ඩලයට ක්‍රියාවලියක් ඇති බව පාලනය කිරීම, පහත සඳහන් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සහ ක්‍රියාපටිපාටි (අවදානම් රුචි ප්‍රකාශය සහ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය) සමාලෝචනය කිරීම, ඩොයිෂ් බැංකුව ඒජී හි අවදානම් අවස්ථාව පිළිබඳ ඇගයීම සහ පාලනය සඳහා කමිටුව විසින් අදාළ යයි කල්පනා කරන වෙනත් යම් කරුණු පාලනය කිරිම සහ ව්‍යාපාරය සහ අවදානම් උපායමාර්ග පිළිබඳ සමූහයේ පාලන ගැලපුම සම්බන්ධයෙන් වාර්තා ලබා ගැනිම සඳහා අවදානම් කමිටුව වගකීමට බැඳි සිටී.

නියාමන පාලන කමිටුව (2022 ජූලි 28 සිට, මෙයට පෙර ඒකාබද්ධ කමිටුව)

ආචාර්ය ඩග්මර් වල්කාසල්, සභාපති, ලුඩ්විග් බිගෝමෙයර් - බර්ටෙන්ස්ටෙයින් (2023 මැයි 17 දක්වා), ජෑන් ඩස්වෙක් (2023 මැයි 17 සිට), සිග්මර් ගාබ්‍රියෙල්, ටිමෝ හෙයිඩර්, ගාබ්රිලේ ප්ලට්චර් (2023 මැයි 17 දක්වා), ස්ටේෆන් සුක්ලාස්කි (2023 මැයි 17 සිට), ඇලෙක්සැන්ඩර් වයිනැන්ඩ්ට්ස් කමිටුවේ සාමාජිකයින් වෙති.

නීතිමය අවශ්‍යතා, බලධාරීන්ගේ රෙගුලාසි සහ සමාගමට අයත් අභ්‍යන්තර ප්‍රතිපත්ති (නිවාරණ අනුකූලතා පාලනය) සමඟ සමාගමේ අනුකූලතාව සහතික කරන කළමනාකරණ මණ්ඩලයේ ක්‍රියාමාර්ගවලට අඛණ්ඩව උපදෙස් දීම සහ නියාමනය, ව්‍යාපාර කටයුතු සහ විශේෂයෙන් විශේෂ විගණන, සැලකියයුතු පැමිණිලි සහ මූල්‍ය වාර්තා සහ විගණන කරුණුවලට අදාළ නොවන ප්‍රමාණය දක්වා ජර්මන් සහ විදේශීය බැංකු නියාමන බලධාරීන්ට අනුව වෙනත් සුවිශේෂී ක්‍රියාමාර්ග සඳහා සැලකියයුතු අදාළත්වයක් සහිතව අඛණ්ඩ පදනමක් මත කමිටුවට දැනුම් දීම, සමාගමේ සේවකයින්ගේ සමාගම තුළ මෙන්ම පිටත දී සෑම ආකාරයකින්ම ආදර්ශවත් හැසිරීම පෝෂණය කිරීම සහ එම හැසිරීම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට විධිමත් අනුකූලතාවයට එකඟවීම පමණක් නොව ඉහළම අවදානම් ආශ්‍රිත නිතිමය ක්‍රියාමාර්ග නියාමනය මගින් අධික්ෂණ මණ්ඩලයට සහයවීම සඳහා නිරන්තරව බැංකුවේ චර්යා සංග්‍රහය සහ සදාචාර මෙන්ම එහි ප්‍රතිපත්ති රාමුව සමාලෝචනය කිරීම, ඉල්ලීම මත, අවදානම් කමිටුව බැංකුවට වැදගත් වන නීතිමය සහ කීර්තිනාම අවදානම් නියාමනය සහ විශ්ලේෂණය කිරීම, මෙම අරමුණ සඳහා, එවැනි අවදානම්වල (බැංකුවේ චර්යා සංග්‍රහය සහ සදාචාර) වැදගත්කම පිළිබඳ දැනුවත්භාවය ඇති කරන ආකාරය පිළිබඳව කළමනාකරණ මණ්ඩලයට උපදෙස් ලබාදීම, පාරිශ්‍රමික පාලන කමිටුවේ ඉල්ලීම මත සැලකියයුතු විමර්ෂණ සහ ඒවායේ සංවර්ධනය පිළිබඳව නිරතුරුව දැනුවත් කිරීම, එවැනි විමර්ෂණ සම්බන්ධයෙන් කළමනාකරණ ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලය විශ්ලේෂණය කිරීම, ඉල්ලීම මත, හිමිකම් ඉල්ලා සිටීම සම්බන්ධ අධීක්ෂණ මණ්ඩලයේ තීරණ සඳහා සභාපතිගේ කමිටුවේ නිර්දේශ සකස් කිරීම පිළිබඳ උපදෙස් ලබාදීම හෝ කළමනාකරණ මණ්ඩලයේ වත්මන් සහ හිටපු සාමාජිකයින්ට විරුද්ධව වෙනත් ක්‍රියාමාර්ග ගැනීම සඳහා නියාමන පාලන කමිටුව වගකීමට බැඳි සිටින අතර එහි සභාපති සභාපතිගේ කමිටුවේ නිර්දේශ සාකච්ඡා කරයි.

පාරිශ්‍රමික පාලන කමිටුව

මහාචාර්ය වෛද්‍ය නෝබට් වින්කේල්ජොහැන්, සභාපති, ජෑන් ඩස්වෙක් (2023 මැයි 17 සිට), ටිමෝ හෙයිඩර් (2023 මැයි 17 සිට), ඩෙට්ලෙෆ් පොලස්වෙක් (2023 මැයි 17 දක්වා), බර්න්ඩ් රෝස් (2023 මැයි 17 දක්වා), ජර්ගන් ටොගෙල් (2023 මැයි 17 සිට), ආචාර්ය ඩග්මර් වල්කාසල්, ප්‍රෑන්ක් වර්නේක් (2023 මැයි 17 දක්වා)ල ඇලෙක්සැන්ඩර් වයිනැන්ඩ්ට්ස් කමිටුවේ සාමාජිකයින් වෙති.

කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් සඳහා පාරිශ්‍රමික පද්ධතිය සුදුසු පරිදි ව්‍යුහගත කිරීමේදී අධීක්ෂණ මණ්ඩලයට සහයවිම, කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් සහ සේවකයින් සඳහා පාරිශ්‍රමික පද්ධතියේ සුදුසු ව්‍යුහය සහ විශේෂයෙන් අනුකූලතා අංශයේ ප්‍රධානියාගේ මුදල් විශුද්ධිකරණ නිලධාරියා සඳහා සහ බැංකුවේ සහ ඩොයිෂ් බැංකු සමූහයේ සමස්ථ අවදානම් පැතිකඩ මත සැලකියයුතු බලපෑමක් ඇති සේවකයින් සඳහා පාරිශ්‍රමිකයේ සුදුසු ව්‍යහුය නියාමනය කිරිම, බලධාරීන්ගේ රෙගුලාසි සහ සමාගමට අයත් අභ්‍යන්තර ප්‍රතිපත්ති (අනුෂංග කළමනාකරණය) කඩකිරීම් සම්බන්ධයෙන් පාරිශ්‍රමික පද්ධතිය තුළ විශේෂයෙන් ලබාගත හැකි ක්‍රියාමාර්ග භාවිතය සහ එහි ඵලදායිත්වය වසරකට වරක් සමාලෝචනය කිරිම, සමාගමේ සේවකයින් සඳහා පාරිශ්‍රමික පද්ධතියේ සුදුසු ව්‍යුහය නියාමනයේදී අධීක්ෂණ මණ්ඩලයට සහයවිම, අවදානම්, ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතා කළමනාකරණය මත පාරිශ්‍රමික ව්‍යුහයේ බලපෑම් ආමන්ත්‍රණය කිරීම සහ ආයතන සඳහා පාරිශ්‍රමික ආඥාපනතේ :ෂබ්චසඑමචිඩැරටඩ* 4 වගන්තියේ වැඩිදුර අවශ්‍යතාවන් සලකා බලමින් පාරිශ්‍රමික පද්ධති සහ පාරිශ්‍රමික හා උපායමාර්ගය - ඩොයිෂ් බැංකුව ඒජී සහ ඩොයිෂ් බැංකු සමූහයේ ව්‍යාපාර සහ අවදානම් උපායමාර්ගවල දක්වා ඇති පරමාර්ථ අත්කර ගැනීම හා පෙළගැසී ඇති බව සහතික කිරීම, කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින්ගේ පාරිශ්‍රමිකය පිළිබඳව අධීක්ෂණ මණ්ඩලයේ යෝජනාව සකස් කිරීම, විශේෂයෙන් සමාගමේ අවදානම් සහ අවදානම් කළමණාකරණය පිළිබඳ යෝජනාවල බලපෑම සලකා බැලීම, කොටස්හිමියන්ගේ, ආයෝජකයින්ගේ සහ වෙනත් පාර්ශවකරුවන්ගේ දීර්ඝ කාලීන යහපත මෙන්ම පොදු යහපත සැලකිල්ලට ගනු ලැබිම, (InstitutsVerg) 7 සලකා බලමින් ජර්මන් බැංකුකරණ පනතේ KWG 45 (2) වගන්තියේ 1 ඡේදයේ අංක 5 අ ට අනුකූලව කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් සඳහා විචල්‍ය පාරිශ්‍රමිකයේ මුළු එකතුව නියම කිරීම පිළිබඳ අධීක්ෂණ මණ්ඩලයේ යෝජනාව සකස් කිරීම සහ කාර්යසාධනයට සුදුසු පරාමිති, දායකමුදල්, ගෙවීම සහ ප්‍රමාද කාලසිමා සහ ප්‍රමාද විචල්‍ය පාරිශ්‍රමිකයෙන් හෝ හිමිකමෙන් දැනටමත් බෙදාහැරි විචල්‍ය පාරිශ්‍රමිකයේ ප්‍රතිලබ්ධියට සම්පූර්ණයෙන් අහිමි කිරිම හෝ කොටසක් අඩුකිරිම සඳහා කොන්දේසි සකස් කිරීම, යොදාගත් පිරිවිතර තවමත් සුදුසුද යන්න නිරන්තරව අවම වශයෙන් වාර්ෂිකව පරීක්ෂා කිරීම, පිළියම් සැලසුම් යම් හඳුනාගත් විෂමතා සඳහා සංවර්ධනය කිරිම, ෂබ්චසඑමචිඩැරටඩ 27 (2) වගන්තියේ 1 ඡේදයට අනුකූලව සමූහයේ අවදානම් දරන්නන් හඳුනා ගැනීමේ ක්‍රියාවලිය සහ සේවකයින් සඳහා පාරිශ්‍රමික පද්ධතියේ සුදුසු ව්‍යුහය නියාමනය කිරීමේදී අධීක්ෂණ මණ්ඩලයට සහයවීමේ කොටසක් ලෙස, නිරන්තරව නමුත් අවම වශයෙන් වාර්ෂිකව, විශේෂයෙන් විචල්‍ය පාරිශ්‍රමිකයේ මුළු ගණන (InstitutsVerg) 7 වගන්තිය සලකා බලමින් KWG 45 (2) වගන්තියේ 1 ඡේදයේ අංක 5 අ ට අනුකූලව නියම කර තිබේද යන්න සහ - කාර්යසාධනයට පාරිශ්‍රමික පරාමිති, දායක මුදල් තක්සේරු කිරීමේ විශේෂිත මූලධර්ම මෙන්ම විචල්‍ය පාරිශ්‍රමිකයේ සම්පූර්ණයෙන් අහිමි කිරිම හෝ කොටසක් අඩුකිරිම සඳහා කොන්දේසි ඇතුළුව ගෙවිම සහ ප්‍රමාද කාලසිමා සුදුසු වන්නේද සහ - පාලන කාර්යයන් හී සේවකයින්ගේ පාරිශ්‍රමික පද්ධති ෂබ්චසඑමචිඩැරටඩ අවශ්‍යතාවලට අනුකූල වන්නේද යන්න පරීක්ෂා කිරීම, අභ්‍යන්තර පාලනය සහ වෙනත් අදාළ ක්ෂේත්‍ර පාරිශ්‍රමික පද්ධති ව්‍යුහගත කිරීමේදී විධිමත් පරිදි මැදිහත් වන්නේද යන්න නියාමනය තුළ අධීක්ෂණ මණ්ඩලයට සහයවීම, KWG 6 25අ වගන්තියේ 6 ඡේදයට අනුව විචල්‍ය සහ ස්ථිර පාරිශ්‍රමිකය ව්‍යුහගත කිරිම පිළිබඳ විසඳුම් සඳහා යෝජනා සකස් කිරීමේදී අධීක්ෂණ මණ්ඩලයට සහයවීම සඳහා පාරිශ්‍රමික පාලන කමිටුව වගකීමට බැඳි සිටී.

උපායමාර්ගික සහ තිරසාර කමිටුව (2022 දෙසැම්ර් 15 සිට, මෙයට පෙර උපායමාර්ගික කමිටුව)

ජෝන් ඇලෙක්සැන්ඩර් තායින්, සභාපති, මයිරී ක්ලාක්, ක්ලවුඩියා ෆෙයිබර්(2023 මැයි 17 සිට), ෆ්ලෝරියන් හැගන්මිලර් (2024 ජනවාරි 31 සිට), ටිමෝ හෙයිඩර් (2023 මැයි 17 දක්වා), බිර්ගිට් ලවුමන් (2023 මැයි 17 සිට 2024 ජනවාරි 12 දක්වා), ඩෙට්ලෙෆ් පොලස්වෙක් (2023 මැයි 17 දක්වා), ප්‍රෑන්ක් වෙවුල්ස් (2023 මැයි 17 සිට), ජර්ගන් ටොගෙල් (2023 මැයි 17 සිට), මයිකල් ට්‍රොග්නි, ස්ටේෆන් විර්ටෙල් (2023 මැයි 17 දක්වා), ප්‍රෑන්ක් වර්නේක් (2023 මැයි 17 දක්වා)ල ඇලෙක්සැන්ඩර් වයිනැන්ඩ්ට්ස් කමිටුවේ සාමාජිකයින් වෙති.

බැංකුවේ උපායමාර්ගයට අදාළ පාලන වගකිම් ඉටු කිරීමේදී අධීක්ෂණ මණ්ඩලයට සහයවීම, බැංකුවේ තිරසාර සංවර්ධනයට අදාළ ව්‍යාපාර උපායමාර්ග අර්ථ දැක්වීම සහ යහපත්, වගකීම්සහගත කළමනාකරණයේ මූලධර්ම පිළිපැදිම, සමාගමේ සමාජීය වගකිම් ඉටු කිරිම සහ පරිසරයේ ස්වභාවික සම්පත් (පාරිසරික, සමාජීය සහ පාලන (ESG) ගැටළු) ආරක්ෂා කිරීම, මෙන්ම ඒවායේ ක්‍රියාත්මක කිරීම, ව්‍යාපාර උපායමාර්ගය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, තක්සේරු කිරිම සහ ගැලපීම සඳහා ක්‍රියාවලිය ස්ථාපිත කිරිම, ඩොයිෂ් බැංකු සමූහය සහ එහි ව්‍යාපාර අංශවල උපායමාර්ගික අනාගත කටයුතු, දිශානතිය සහ උපායමාර්ගයේ සංවර්ධනය පිළිබඳ කළමනාකරණ මණ්ඩලයේ කාර්යයන් පාලනය කිරීම, කළමනාකරණ මණ්ඩලය විසින් උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීම සහ උපායමාර්ගික සන්ධිස්ථාන සහ ඉලක්ක අනුව ප්‍රගතිය ක්‍රියාවට නැංවිම පාලනය කිරීම, කළමනාකරණ මණ්ඩලය විසින් ප්‍රධාන ව්‍යාපාර පරිනාමන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම සහ ක්‍රියාත්මක කිරීම පාලනය කිරිම, - පාලනය, අවදානම් රුචිය, මූල්‍ය සහ ප්‍රාග්ධනය සැලසුම් කිරීම, ද්‍රවශීලතාව සහ අරමුදල් කළමනාකරණය, පරිසරය සහ සම්පාත් පාලනය බැංකුවේ උපායමාර්ගික පරමාර්ථවලට සහයවන්නේද යන්න පිළිබඳව - පශ්චාත් ගනුදෙනු කාර්යසාධන පසුවිපරම ඇතුළුව ආපසු පැවරීම සහ ඒකාබද්ධකිරීම සහ අත්කර ගැනීමේ උපායමාර්ගය පිළිබඳ - තරඟකාරී පරිසරය තුළ වෙනස්වීම්වල බලපෑම පිළිබඳ -කළමනාකරණ මණ්ඩලය සමඟ සාකච්ඡා කිරීම සහ උපදෙස් දීම, අධීක්ෂණ මණ්ඩලය සමාගමේ උපායමාර්ගය පූර්ණ වශයෙන් ආමන්ත්‍රණය කරන අධීක්ෂණ මණ්ඩල රැස්වීම සූදානම් කිරීමේ දී කළමනාකරණ මණ්ඩලයට උපදෙස් ලබාදීම, සාංගමික ව්‍යවස්ථාවලියේ 13 (1) (ආ) සහ (1) ඈ වගන්තිවලට අනුව එහි අනුමැතියට යටත් ගනුදෙනු පිළිබඳ අධීක්ෂණ මණ්ඩලයේ තීරණය සකස් කිරිම සඳහා උපායමාර්ගික හා තිරසාර කමිටුව වගකීමට බැඳි සිටී.

තාක්ෂණ, දත්ත සහ නවෝත්පාදන කමිටුව

මයිකල් ට්‍රොග්නි, සභාපති, සුසේන් බිලෙයිඩ් (2023 මැයි 17 සිට), ජෑන් ඩස් වෙක් (2023 මැයි 17 දක්වා), මන්ජා එයිෆර්ට් (2023 මැයි 17 සිට), ක්ලවුඩියා ෆෙයිබර් (2023 මැයි 17 සිට 2024 ජනවාරි 31 දක්වා), ෆ්ලෝරියන් හැගන්මිලර් (2024 ජනවාරි 31 සිට), මර්ටිනා ක්ලී (2023 මැයි 17 දක්වා), බර්න්ඩ් රෝස් (2023 මැයි 17 දක්වා), යන්ගව් සලයින්ස්ටැඩ් සහ ඇලෙක්සැන්ඩර් වයිනෑන්ඩ්ස් කමිටුවේ සාමාජිකයින් වෙති.

බැංකුවේ නවෝත්පානය, දත්ත සහ තාක්ෂණික පරිසරයට අදාළ සිය පාලන වගකීම් ඉටු කිරීමේදී මෙම කමිටුව අධීක්ෂණ කමිටුවට සහය වන අතර එමනිසාම අඛණ්ඩවම බැංකුවට ප්‍රමාණවත් තාක්ෂණික සහ ආයතනික සම්පත් තිබේද සහ විශේෂයෙන් තොරතුරු තාක්ෂණ පද්ධති සහ අදාළ තොරතුරු තාක්ෂණ ක්‍රියාවලිවල සැකැස්ම සඳහා පොදුවේ ස්ථාපිත ප්‍රමිති සමඟ ඒවායේ යොදා ගැනිම පිළිබඳව ප්‍රමාණවත් සැලැස්මක් තිරණය කර තිබේද යන්න සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලයට උපදෙස් ලබාදී නියාමනය කරයි. මේවාට විශේෂයෙන් තොරතුරු තාක්ෂණ උපායමාර්ගය සහ එහි තිරසාරභවය පිළිබඳ කළමනාකරණ මණ්ඩලයේ කටයුතු පාලනය කිරීම සහ පරමාර්ථ එනම් තොරතුරු තාක්ෂණ පාලනය, තොරතුරු ආරක්ෂන කළමනාකරණය, පරිශීලක ප්‍රවේශ කළමනාකරණය, ප්‍රධාන තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ යෙදුම් සංවර්ධනය, දත්ත උපස්ථ ඇතුළුව තොරතුරු තාක්ෂණ මෙහෙයුම, තොරතුරු තාක්ෂණ සේවාවල වෙනත් බාහිර ප්‍රසම්පාදන ලබාගැනීම, ඒවායේ ක්‍රියාත්මක කිරීම ඇතුළුව දත්ත පාලනය සහ දත්ත උපායමාර්ගය සහ ඩොයිෂ් බැංකුවේ තොරතුරු තාක්ෂණ පද්ධති සහ සේවා හෝ දත්තවල ගුණාත්මකභාවය සම්බන්ධයෙන් ඇතිවියහැකි වෙනත් සැලකියයුතු ගැටළු සහ එම පරමාර්ථ අත්කර ගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග සඳහන් කිරීම ඇතුළත් වේ.

තවද, සභාපතිගේ කමිටුව, නාමයෝජනා කමිටුව, විගණන කමිටුව, අවදානම් කමිටුව, නියාමන පාලන කමිටුව, පාරිතෝෂික හා දීමනා පාලන කමිටුව, උපාය මාර්ග හා තිරසාර කමිටුව, සහ තාක්ෂණ, දත්ත සහ නවෝත්පාදන කමිටුව පිළිබඳ වැඩිදුර විස්තර වෙන වෙනම යොමු නියමයන් හී දක්වා ඇත. වර්තමාන පිටපත් අධීක්ෂණ කමිටුවේ යොමු නියමයන් සමඟ අපගේ වෙබ් අඩවියෙන් ලබාගත හැකිය. (www.www.db.com/ir/en/documents.htm බලන්න).

www.skillsads.com